ද මැසිනොද් විදුහල, කඳාන

**De Mazenod College Kandana**

5.04.2018

# සිංහල I

12 ශ්‍රේණිය

කාලය පැය 03

3 Pages

1 ප්‍රශ්නයේ සියළුම කොටස් වලට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර 2 - 7 අතර ප්‍රශ්න වලින් තුනකට පමණක් පිළිතුරු සපයන්න.

Learning Resource Center
R
De Mazenod College
Kandana

1 (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලක්දිව දේශපාලන සංස්ථා විකාශනය දෙස අවධානය යොමු කිරීමේ දී දක්නට ලැබෙන භාරතීය සංස්ථාවල ආභාසය ද විමසිල්ලට ලක් විය යුතු ය. ලක්දිව පාලන තන්ත්‍රයෙහි භාරතයේ ඍග්වේද කාලය තරම් ඈත අවධියක එන ග්‍රාමණී වැනි නිලධාරීහු ක්‍රිස්තු පූර්ව යුගයේ සිට ම හමු වෙති. එසේ වුව ද ඔවුනට අයත් කාර්යයන් හෝ තත්ත්වය අතින් හෝ ඔවුනොවුන් සමාන කළ නොහැකි බැව් සිහිපත් කළ යුතු වේ. භාරතයේ ප්‍රකට ව දක්නට ලැබෙන 'මහරජ' වැනි රාජවිරුද සිංහල රජවරුන් මුල සිට ම ව්‍යවහාර කළ බවට සෙල්ලිපි දෙස් දෙයි. රාජාභිෂේකය වැනි උත්සව පිළිබඳ ව ප්‍රමාණවත් සාධක ශේෂ වී නැතත්, එහි දී භාරතීය අභිෂේකයේ බලපෑමක් නොතිබිණැ'යි කිව නො හැකි ය. දේවානම්පියතිස්ස රජුගේ අභිෂේකය අශෝක අධිරාජයාගේ අනුග්‍රහයෙන් සිදු කරන ලද්දේ නම් එහි දී භාරතීය පිළිවෙත් ගරු කළ බැව් සිතීමට ඉඩ තිබේ. එහෙත් භාරත රජවරුන් සාර්වභෞම බව දක්වමින් උත්කර්ෂවත් අන්දමින් පැවැත්වූ අශ්වමේධ රාජසූය වැනි යාගහෝම මෙරට රාජත්වය විකාශනයෙහි කිසි ම අවස්ථාවක දක්නට නො ලැබේ. රාජ්‍යපාලනයේ ප්‍රධාන ලක්ෂණ ලෙස කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රයේ දැක්වෙන අන්දමට යුද්ධ හමුදාව (දණ්ඩ) භාණ්ඩාගාරය (කෝෂ) හා වරපුරුෂ සේවය මහාපරාක්‍රමබාහුගේ පාලන යන්ත්‍රයේ ද ප්‍රමුඛ අංගලක්ෂණ බවට පත් වී තිබුණු බැව් දක්වා ඇතත් එම ප්‍රවෘත්තිය වුව ද එසේ ම පිළිගත යුතු නො වේ. පරාක්‍රමබාහු රජුගේ චරිත නිරූපණයේ දී මෙන් ම රාජ්‍යපාලන සංවිධාන විස්තර කිරීමේ දී චූලවංසකරු කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රය ආධාර කර ගැන්ම ද සිදු වීමට ඉඩ තිබුණු බැවිනි. එහෙත් මෙකී බලපෑම්වල ප්‍රකෘති ස්වරූපය පිළිබඳ ව වඩාත් පරීක්ෂාකාරී වීමේ දී, එකී සංස්ථා ද දේශීය බලපෑම් අනුව විකාශනය වූ බැව් සැලකිමට පිළිවන. මේ ගැන විවරණයකට මෙහි අවකාශ නැතත්, ලක්දිව රාජත්වය විකාශනය වූ ආකාරය මීට කදිම නිදර්ශනයකි.

(i) භාරතීය රජවරුන් විසින් බහුල ව භාවිත කරන ලද මහරජ වැනි විරුද නාම ලංකාවේ රජවරුන් විසින් ද භාවිත කරන ලද ආකාරය තහවුරු කෙරෙන්නේ කවර මූලාශ්‍රයකින් ද?

(ii) රාජාභිෂේකය සම්බන්ධයෙන් භාරතීය සිරිත් විරිත් මෙරටට බලපාන්නට ඇති බව ලේඛකයා පවසන්නේ කුමන කරුණක් නිසා ද?

(iii) කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රයෙහි සඳහන් වන රාජ්‍යපාලනය සම්බන්ධ ප්‍රමුඛ අංග මොනවා ද?

(iv) ක්‍රි. පූ. යුගවල සිට ම භාරතීය බලපෑම මෙරට පාලන තන්ත්‍රයට ලැබුණු බවට මෙහි සඳහන් සාක්ෂිය කුමක් ද?

(v) මෙම පාඨයෙහි සඳහන් වන පරාක්‍රමබාහු රජතුමා පිළිබඳ තොරතුරු සඳහන් වන වංසකතාව කුමක් ද?

(ලකුණු 10 යි.)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, එහි අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

භූ කම්පන මාන පද්ධතියක් භාවිතයෙන් යම් ප්‍රදේශයක ඇතිවන භූමිකම්පා පිළිබඳ අධ්‍යයනය කිරීම ඉතාමත් අපහසු වේ. ඒ සඳහා තම රටෙහි සහ එම රට ආසන්නයෙහි භූමිකම්පා අධ්‍යයනය කිරීමට හැකිවන පරිදි සූක්ෂම භූ කම්පන මානවලින් ද සමන්විත රටට ගැළපෙන භූ කම්පන මාන පද්ධතියක් ස්ථාපිත කර එය කලාපයේ පිහිටි වෙනත් රටවල භූ කම්පන මාන ජාල සමඟ සම්බන්ධ කළ යුතු ය. ඉන් එම කලාපයේ ඇතිවන භූමිකම්පා පිළිබඳ හොඳින් අධ්‍යයනය කිරීමට හා නිවැරදි සුනාමි පූර්ව අනතුරු ඇඟවීම් දෙන පද්ධතියක් ස්ථාපිත කිරීමට ද හැකි වේ. මෙවැන්නක් ස්ථාපිත කිරීම ආර්ථික වශයෙන් දැරීමට අපහසු මුදලක් වැයවෙන කාර්යයක් වුවත් මෙවන් පද්ධතියක් ස්ථාපිත නොකරන තාක්කල් ඇමරිකාවේ භූ විද්‍යා පර්යේෂණ ආයතනය මගින් නිකුත් කරන භූමිකම්පා පිළිබඳ දැනුම් දීම මත, හවායිවල පිහිටි සුනාමි පූර්ව අනතුරු ඇඟවීම් දෙන ආයතනය මගින් නිකුත් කරන නිවේදන මතින් යැපීමට අපට සිදුවනු ඇත.

2004 වර්ෂයේ දී ලංකාවට බලපාන ලද සුනාමියට හේතු වූ ආකාරයේ විශාල භූමිකම්පා ඇතිවීම ඉතාමත් විරලවන අතර, එවන් විශාල ශක්තියක් එකවර පිට කිරීමට ඇති හැකියාව ඉතා අල්ප බැවින්, එවැන්නක් සිදුවීම කාලාන්තරයක් ගත වී සිදුවන සිදුවීමක් ලෙස දැක්විය හැකි ය. සාපේක්ෂව කුඩා භූමිකම්පාවක් ඇති වූ විට ද සුනාමි තත්ත්වයක් ඇතිවන අතර, එහි වෙනස රළ පහරට සාපේක්ෂව ඉතා කුඩා නිසා අපට නොදැනෙන නමුත්, විශාල භූමිකම්පාවක් නිසා ඇතිවන රළ පහරේ වෙනස්වීම වැඩි නිසා විශාල සුනාමියක් ලෙස අපට දැනේ. මෙම ස්වාභාවිකව ඇතිවන මෙවන් සිද්ධි වැළැක්වීමට තව ම විද්‍යාව දියුණු නැති අතර, කළ හැකි දෙය වන්නේ, මෙය අප ඉදිරියේ ඇති අනාගත විපත් ඇතිවීම කලින් පුරෝකථනය කර, එයට සූදානම් වීම පමණි.

පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 350ට නොඅඩු රචනාවක් ලියන්න.

1. දේශපාලන ස්ථාවරත්වය හා රටේ සංවර්ධනය.
2. වර්ථමාන සිනමාව සහ ජනතා සහභිත්වය
3. මත් ද්‍රව්‍ය උවදුර සහ තරුණ ජීවිත
4. ලංකාවේ වර්ධනය වෙමින් පවතින අපරාධ රැල්ල
5. පුරා වස්තු සුරැකීමේ ජාතික වගකීම
6. ක්‍රීඩාව සහ සංවර්ධනය

(ඉ) පහත සඳහන් කවි පංතිය පිළිබඳ රසාස්වාදයක් ලියන්න.

මිනිහා නගන කටහඬ නො ම වැකෙන කනේ
ඈත මේ කුරුලු කූඩුව උස ගහක බෙනේ
නැත උවදුරක් මෙහි මෙතුවක් පහළ වුණේ
පැටවගෙ කුඩා දෙනෙතට තිල් අහස පෙනේ

උණුසුම් ගතිය ඇතිමුත් සිය කැදැල්ලෙහි
පැටවා කැමති නැත හිර වී විසිල්ලෙහි
දෙනෙතට නිල් අහස යොමු වන ඇසිල්ලෙහි
ඔහු යෙදෙනවා නිදහස ගැන සෙවිල්ලෙහි

මවුපිය කුරුල්ලන් රැකවරණය ඇතුව
උන්ගේ ආලයේ වෙසෙතත් ගජමුතුව
පැටවගෙ දෙනෙත පවතී කවදත් රතුව
සැපතක් ඔහුට නැත ඉගිළෙන්නට නැතුව

දවසට සිය විටක් මවු පිය දෙදෙන විසින්
කටට ම හෙළන මුත් ආහර කුරුලු රසින්
පිට් වන තුරා ඔහු හිර වී සිටින ගසින්
ඉගිළෙන සිහින පිට මං කළ නොහැක හිසින්

අරුණලු වැටෙයි පොඩී සිදුරෙන් කුරුලු ගෙට
ගී හඬ පිටත් වෙයි රුක් ලිය මුදුන සිට
කවුළුව තුළින් එළියට හිස දමන විට
හොඳ බව පෙනෙයි මෙහි ඇතුළට වැඩිය පිට

උවදුරු එමට ඇති මුත් එළිමහන කුරේ
පැටවට පෙනෙයි එහි පවතින කුරුලු පොරේ
කොපමණ කලක් ගත වේවි ද මෙහෙම හිරේ
සිතිවිලි නිසා ඇති නිදිබර ගතිය හැරේ

සටනක් නැති ව සැපතක් ඇති විය නොහැක
මේ රැකවරණ තුළ ඇති සුවසිරි දුකෙක
උවදුරු දිගේ යන දිග මාවත මිසක
නිදහස කරා යන වෙන පාරක් කිමෙක

මවුපිය කුරුල්ලන් ආහර රැගෙන කටින්
ආවා පුරුදු ලෙස පැටියා දකින අටින්
දුටුවා හිස් ව ඇති බව ගෙය එහෙම පිටින්
පැටවා ගිහින් එළි වෙන කොට හතර වටින්

5.04.2018
සිංහල 1
12 ශ්‍රේණිය

පහත සඳහන් ප්‍රශ්න වලින් ප්‍රශ්න තුනක් පමණක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

02) සද්ධර්මරත්නාවලියේ කථා කලාවේ විශේෂතා නියමිත කතා වස්තු දෙකේ නිදසුන් මගින් පැහැදිලි කරන්න.

03) සද්ධර්මලංකාරය පොදු ජනයා තුළ කුසල ක්‍රියාවන්හි නියැලීමේ අරමුණින් රචිත ග්‍රන්ථයකි. නියමිත කතාවස්තු ඇසුරින් පහදන්න.

04) බැද්දේගම නව කතාවෙන් නිරූපණය වන භාෂා ශෛලිය නිදසුන් දෙමින් විස්තර කරන්න.

05) කොළඹ යුගයේ කවියන්ගේ පද්‍ය රචනාවන්හි විශේෂතා නිදසුන් පද්‍ය තුනක් ආශ්‍රයෙන් විස්තර කරන්න.

06) ගුත්තිල කවියා කිසියම් අවස්ථාවක් ජීවමාන අයුරින් ඉදිරිපත් කිරීමට සමතෙකි අදාළ වර්ණනා මගින් නිදසුන් ගෙන ඔබගේ අදහස් දක්වන්න.

07) නූතන කෙටිකතා කරුවන් අවස්ථා හා සිද්ධි ඉදිරිපත් කිරීමේදී දක්වන කුසලතාව නිදසුන් තුනක් දෙමින් විස්තර කරන්න.

Learning Resource Center
R
De Mazenod College
Kandana